## කොළඹ විශ්ව විද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - රාජගිරිය
## 05 වන බී.ඒ.එම්.එස් අතිරේක පරීක්ෂණය - 2016 ජූලි

### දේශීය චිකිත්සා

කාලය - පැය 03
ප.ව. 1.00- ප.ව 4.00

සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
පිළිතුරු ලිවීමේ දී සෑම කොටසක් සඳහාම වෙන වෙනම පිළිතුරු ලිවීමේ පොතක් භාවිත කරන්න.

### I කොටස (පොදු කොටස)

01\. i. (අ) දිය පීනස, ගඳ පීනස, ලේ පීනස යන රෝගයන්හි ප්‍රධාන රෝග ලක්ෂණ වෙන වෙනම දක්වන්න. (ලකුණු 05)

(ආ) පීනස් රෝග සඳහා යෙදිය හැකි හිස ගැල්වුමක් සහ දුම් බෙහෙතක් බැගින් වට්ටෝරු ගත කරන්න. (ලකුණු 05)

ii. (අ) ගුද මග බැහැරට පැමිණීම දේශීය චිකිත්සාවේ හඳුන්වන්නේ කෙසේද? (ලකුණු 01)

(ආ) එය ඇතිවීමට හේතු, ලක්ෂණ සහ සාධ්‍ය අසාධ්‍යතාවය සඳහන් කරන්න. (ලකුණු 04)

(ඇ) ඒ සඳහා බාහිර සහ අභ්‍යන්තර ප්‍රතිකාර ලියා දක්වන්න. (ලකුණු 05)

02\. i. ප්‍රධාන වාත රෝගයක් වන අංශභාග රෝගය සඳහා කෂාය, ගුලි, කල්ක, චූර්ණ ඇතුලත් චිකිත්සා පද්ධතියක් විස්තර කරන්න. (ලකුණු 12)

ii. මාන්දම් චිකිත්සාවේ අග්නිය වැඩි කිරීමට යෙදිය හැකි කෂාය, ගුලි, චූර්ණ දෙක බැගින් ලියන්න. (ලකුණු 08)

## II කොටස(සර්ප විෂ)

03. i. හොස්සට කියනා නම දැන ගන්නේ .............යන කවිය සම්පූර්ණ කර එහි අර්ථය ලියන්න. (ලකුණු 0

ii. සර්ප විෂෙන් මිය ගිය පුද්ගලයෙක් හා විෂ මූර්ජා වූ අයෙක් වෙන්කර හඳුනා ගන්නේ කෙසේද? (ලකුණු 0

iii. පහත සඳහන් ගැට පද වල සැගවී ඇති ඖෂධය නම් කරන්න.

(අ) මන්ද පනික්කිල
(ආ) නවරත්න කුමාරයා
(ඇ) ධම්මං සරණං
(ඈ) විජයා නෝනා
(ඉ) විදුරඹ (ලකුණු 05

iv. නාග විෂට ප්‍රතිකාර පද්ධතියක් ලියන්න. (ලකුණු 06

## III කොටස(දැවුම් පිළිස්සුම්)

04. ශරීරය 75% පමණ පිළිස්සුමට ලක්වූ රෝගියෙකුට

i. පහල විය හැකි රෝග ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. සිදු කරන ප්‍රතිකාර පැහැදිලිව ලියා දක්වන්න. (ලකුණු 15)

## IV කොටස(අක්ෂි රෝග)

05. i. මල් පොළ රෝගය ඇසෙහි කුමන ස්ථානයක ඇතිවේද? (ලකුණු 01)

ii. එහි දී කෝප වන ප්‍රධාන දෝෂය කුමක්ද? (ලකුණු 01)

iii. රෝග ලක්ෂණ පැහැදිලිව ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04)

iv. ඊ සඳහා යොදන චිකිත්සා පද්ධතිය වට්ටෝරු සහිතව විස්තර කරන්න. (ලකුණු 14)

**09.09.2016**